**<u>13 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 2 වන සතිය - මැයි 11 සිට 15 දක්වා</u>**

**<u>බඳවා ගැනීම</u>**

ආයතනයකට යෝග්‍ය අයදුම්කරුවන් තෝරා ගැනීමෙන් අනතුරුව ඔවුන් රැකියාවට බඳවා ගනු ලබයි.බඳවා ගැනීමේ ප්‍රධාන ක්‍රම 2කි.

1.ස්ථිර පදනම

2.තාවකාලික පදනම

ස්ථිර පදනම යනු ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයෙකු ලෙස බඳවා ගැනීමයි.තාවකාලික පදනම මත බඳවා ගන්නා සේවකයින්ට පත්වීම් ලිපියේ ඒ පිළිබඳව දක්වා තිබේ.කුමන ක්‍රමය මත බඳවා ගත්තද බඳවා ගැනීමේ ක්‍රමය පහත දක්වා ඇති පියවරයන්ගෙන් සමන්විත වේ.

1.පත්වීම් ලිපි සැකසීම.

2.සේවා අපේක්ෂකයාට දැනුම් දීම.

3.පසු විපරම් සිදු කිරීම.

4.ප්‍රතික්ෂේප කිරීම හෝ භාරගැනීම.

5.රැකියා ගිවිසුමට ඇතුළත් කර ගැනීම.

මෙම ක්‍රියාවලිය සඳහා පත්වීම් ලිපි සැකසීම දෙයාකාරයකින් සිදු විය හැකිය.

1.නව අයදුම්කරුවන්ගේ අයදුම්පත් සැලකිල්ලට ගැනීම.

2.මීට පෙර අයදුම්කර බඳවා නොගෙන රඳවා තබා ගත් අයදුම්පත් අතරින් බඳවා ගැනීම් සිදු කිරීම.

**<u>පත්වීම් ලිපිය</u>**

පත්වීම් ලිපියක් යනු සේවකයෙකු සේවයට පත් කිරීමෙන් පසු එම තැනැත්තාට රැකියාව පිළිබඳ නියමයන්,කොන්දේසි,වගකීම් ආදිය පිළිබඳව සඳහන් කරමින් කළමනාකරණය විසින් ලබා දෙන නීත්‍යානුකූල ලිපියකි.එහි සේව්‍යයාගේ නම හා ලිපිනය,සේවකයාගේ නම,රැකියාවේ ස්වභාවය(ස්ථිර/තාවකාලික),තනතුරු නාමය,වැටුප්,සේවා කොන්දේසි ආදී විස්තර ඇතුළත්ය.

**<u>අභ්‍යාස</u>**

- ✓ පත්වීම් ලිපියක වැදගත්කම සේව්‍ය/සේවක යන අංශ දෙකටම අදාළ වන සේ පැහැදිලි කරන්න.